# පුරාතන ශ්‍රී ලාංකේය හින්දු ගෘහ නිර්මාණ ශිල්ප කලාව පිළිබඳව අධ්‍යයනයක්

එන්. සුරේෂ් කුමාර නවරත්න[1]

පුරාතන ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ ප්‍රබුද්ධ කලාවන්ගේ වර්ධනයක් දක්නට ලැබෙන අතර චිත්‍ර, මූර්ති, කැටයම්, ගෘහ නිර්මාණ ආදී කලාවන් රැසක සාධක හඳුනාගත හැකිය. මෙම සාධක බෞද්ධාගමික පරිසරයෙහි මෙන්ම හින්දු ආගමික පරිසරයෙහි ද වර්ධනය වී තිබේ. මෙහිදී අප විසින් පුරාතන ශ්‍රී ලාංකේය ගෘහ නිර්මාණ ශිල්ප කලාවට කොතෙක් දුරට හින්දු ගෘහ නිර්මාණ ශිල්ප කලාවේ ආභාසය ලැබී තිබේ ද? යන ගැටළුව මූලික කරගෙන මෙම පර්යේෂණය සිදුකරන අතර එහිදී ලාංකේය ගෘහ නිර්මාණ ශිල්ප කලාව පිළිබඳව පුළුල් ලෙස අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ඒ අනුව මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ ලාංකේය ගෘහ නිර්මාණ කලාවෙහි අන්තර්ගත හින්දු ගෘහ නිර්මාණ ලක්ෂණ හඳුනාගැනීමය. ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය හරහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනය, ක්ෂේත්‍ර අධ්‍යයනය ආදිය මගින් දත්ත රැස්කර, විශ්ලේෂණය කර නිගමනවලට එළඹීම සිදු කරන ලදී. මෙහිදී පොලොන්නරු යුගයේ ගෘහ නිර්මාණ ශිල්පයේ ඇති වූ විකරණය, පැරණි ලක්දිව තාක්ෂණවේදය සහ ශිල්ප ඥානය, මාදුටු පොලොන්නරුව, ලංකාවේ ද්‍රවිඩ සිහිවටන, ලංකා ඉතිහාසය ආදී සාහිත්‍යමය මූලාශ්‍ර උපයෝගී කරගෙන අධ්‍යයනය කරනු ලැබූ අතර එමඟින් ලංකාවේ ව්‍යාප්තව පවතින හින්දු ගෘහ නිර්මාණ ශිල්පය යටතේ ගොඩනැගුණු ප්‍රධාන ස්ථානයන් කිහිපයක් පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ. ඒ අතර නාලන්දා ගෙඩිගේ, පොලොන්නරු ශිවදේවාල, විෂ්ණු දේවාල, නෙළුම් පොකුණ, නාතනාර් කෝවිල, ථූපාරාම පිළිමගේ, යාපහුව, ලංකාතිලකය ආදිය වැදගත් තැනක් ගනු ලබන බව පෙන්වාදිය හැකි අතර මෙම ස්ථානයන්වල ද හින්දු ගෘහ නිර්මාණ ශිල්ප කලාවේ ස්වභාවයන් මනාව හඳුනාගත හැකිය. එනම් නාලන්දා ගෙඩිගේ නිර්මාණයේදී නරසිංහවර්මන් හෙවත් මාමල්ල ශෛලිය අනුව නිර්මාණය කර තිබේ. එමෙන්ම පොලොන්නරුවේ ශිව දේවාලයන්හි ශිල්ප කලාව දෙස බැලීමේදී එහි හින්දු, පාණ්ඩ්‍ය ශිල්පීය ලක්ෂණ හඳුනාගත හැකිය. ගම්පොළ ගඩලාදෙණිය විහාරය නිර්මාණයේදී ද්‍රවිඩ ශෛලියට අනුව ගර්භගෘහය, අන්තරාලය, මණ්ඩපයකින් යුතුව ඉදිකර තිබේ. මෙම පර්යේෂණය හරහා සාකච්ඡාවට බඳුන් වන තොරතුරු විමර්ශනයේදී අවසානයෙහි නිගමනය කළ හැක්කේ ශ්‍රී ලාංකේය කලාවෙහි ප්‍රමුඛ ස්ථානයක් ගනු ලැබූ ගෘහ නිර්මාණ ශිල්ප කලාව සඳහා ලක්දිවට ආසන්නයෙහි පැවති දකුණු ඉන්දියානු හින්දු බලපෑම් ඉතා දැඩි වශයෙන් බලපා ඇති බවය.

ප්‍රමුඛ පද : ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ කලාව, හින්දු ආභාසය, දේවාල, කැටයම්, කලා ශිල්පීන්

[1] ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.max.nawarathnasuresh@gmail.com